සියලු ම හිමිකම් ඇවිරිණි)
All Rights Reserved)

# මූලික පිරිවෙන් වර්ෂාවසාන පරීක්ෂණය - 2016

**Primary Piriven Year End Term Test - 2016**

**4 වසර /Grade 4**

**සිංහල**
**SINHALA**

කාලය : පැය 03 යි.
**Time : Three hours**

i. කොටසේ ප්‍රශ්න දෙකට ද ii. කොටසින් එක් ප්‍රශ්නයක් ද iii. කොටසින් ප්‍රශ්න දෙකක් ද තෝරාගෙන ප්‍රශ්න 05කට පිළිතුරු සපයන්න.

I කොටස

01. ආ) පහත සඳහන් මාතෘකා අතරින් එකක් තෝරාගෙන වචන 250කට නො අඩු රචනයක් ලියන්න.

i. මත් උවදුර දුරලමු.
ii. සාරධර්ම අගයන සමාජයක් බිහි කිරීමෙහිලා දහම් පාසල් අධ්‍යාපනය සතු වගකීම.
iii. රැකගත යුතු දේශීය වෛද්‍ය ක්‍රම
iv. නූතන විද්‍යාව හා තාක්ෂණය මානවයාගේ යහපත සඳහා යොදා ගනිමු.
v. ''කියවීම, මිනිසා සම්පූර්ණ කරයි''.

(ලකුණු 25)

ආ) පහත සඳහන් ඡේදය 1/3 වන සේ සාරාංශ කරන්න.

ඈත අතීතයේ සිට මෙරට පොදු ජන දිවිපෙවෙත හැඩ ගැසුනේ කෘෂි ජීවන රටාවක් මුල්කරගෙන ය. කුඹුර, හේන, පැල පොදු ජන කවියේ උල්පත වන තරමට ම කෘෂි ජීවන රටාව හැඩගැසී තිබුණි. වියළි කලාපයේ හේන් ගොවිතැන් කටයුතු බහුල වුව ද වී ගොවිතැන ට ද විශේෂ තැනක් හිමි වී තිබිණ. වී ගොවිතැන් කටයුතු සාර්ථක ව කරගනු ලැබුවේ වැව් දියෙනි. මේ නිසා ගොවියාට වැව අගනා සම්පතක් විය. ඔවුන් තුළ පොදුවේ සොබා දහමේ හැම දායාදයක් කෙරෙහි ම මහත් භක්තියක් තිබූ අතර, වැව ද ඔවුන්ගේ අතිශය ගෞරවයට පාත්‍ර විය. වැව පිළිබඳ ව විවිධ ජනප්‍රවාද ද බිහිවන තරමට මෙම ගෞරවය අසීමිත විය.

(ලකුණු 10)

02. පහත සඳහන් ගද්‍ය පද්‍ය කොටස්වල අදහස ලිහිල් බසින් ලියන්න.

ආ) තවද, මේ තිබ්බටුවාවේ සිද්ධාර්ථ නායක උන්නාන්සේ ගේ ම ශිෂ්‍ය වූ කම්මාවාචා යුගසූත්‍ර බොහෝ දෙනා වහන්සේ ට කියවීමෙහි ද කීම් බණදහම් ශබ්ද ශාස්ත්‍ර පුහුණු පිරුවාණා පොත් ලීමෙහි කුඩා අකුරු ලීමෙහි අතිසමර්ථ බඩගමුවිහාරයෙහි වසන ඊරිවින්නේ විපස්සි උන්නාන්සේ ද, එසේ ම සීමා බන්ධනාදි කම්වදන් කීමෙහි යුග සූත්‍ර කීමෙහි කියවීමෙහි නොමැලි වූ ඇගල්ලේ ඉඳජෝති උන්නාන්සේ ද, ඒ උගත් දේ බොහෝ උන්නාන්සේලාට පුරුදු කරවමින් සෑම ස්ථානවල වසන සංඝයාට ම උගත් දෙයින් උපකාරිව ඒ තැන්වල ම යුතු සේ කල් යවමින් සිටිනවා ය.

(ලකුණු 10)

ආ) පුරඳුරු වන් බඹදත් නර පවරා
සැරහී වෙණ නද අසනුව මියුරා
පුර වැසියන් රැස්වන ලෙස නොහැරා
බෙර පිය වී කරවා මුළු නුවරා

පිරිවර රජ සෙන් සමඟින් ඉඳිනට
සරිකර පුරඳුරු විජයොත් පායට
මෙනුවර මැද මඩුවක් විසිතුරු කොට
මෙහෙවර කී කරව යි අග මැති හට

(ලකුණු 10)

## ii - කොටස

03. ආ) නිවැරදි අක්ෂර වින්‍යාසය සහිත වචනය තෝරන්න.

i. භූමදානය / බූමදානය / භූමදාණය
ii. හස්මාවශේෂ /බස්මාවශේෂ / හස්මාවසේශ
iii. ශිෂ්ටාචාරය / ෂිෂ්ටාචාරය / ශිෂ්‍යාචාරය
iv. ලාංඡනය / ලාන්චනය / ලාංචනය
v. වර්ෂාරම්භය / වර්ෂාරම්බය / වර්ශාරම්භය

(ලකුණු 05)

ආ) පහත සඳහන් විසන්ධි පද සන්ධි කරන්න.

i. සූර්ය + උදය ii. රුවන් + ආර iii. බුදු + සරණ
iv. ශීර්ෂ + ආබාධ v. අති + අලංකාර (ලකුණු 05)

ඇ) පහත සඳහන් සමාස පද යොදා අර්ථවත් වාක්‍ය 05ක් නිර්මාණය කරන්න.

i. ලිපිකරු ii. දුදන iii. අටපිරිකර
iv. දිනකර v. මව්පිය (ලකුණු 05)

04. අ) පහත සඳහන් වාක්‍ය කර්මකාරකයට නගන්න.

i. ළමයි පොත් බලති.
ii. ගුරුතුමා අවවාද දෙයි.
iii. මාර්ටින් වික්‍රමසිංහ ගම්පෙරළිය රචනා කළේය.
iv. ගුරුතුමිය ත්‍යාග ප්‍රදානය කළාය.
v. අපි පොතපත පාඩම් කළෙමු. (ලකුණු 05)

ආ) පහත සඳහන් කෘදන්ත පදවල ප්‍රකෘතිය හා ප්‍රත්‍යය වෙන් කොට දක්වන්න.

i. නැටුම් ii. පිහිටි iii. ලියූ
iv. ලියන v. කැපුණු (ලකුණු 05)

ඇ) පහත සඳහන් අර්ථ ප්‍රකාශ කිරීම සඳහා තද්ධිත නාම දක්වන්න.

i. වඩා ප්‍රිය වූයේ ii. වක බොහෝ වූයේ iii. ඉතා පොඩි වූයේ

iv. දිගට හුරු v. ඉස් පෙදෙස

(ලකුණු 05)

05. ප්‍රදේශයේ දරුවන් සඳහා ක්‍රීඩා පිටියක් ඉදිකර දිය යුතු යැයි සාලියගම දිලෙනතරු තරුණ සමාජයේ මාසික රැස්වීමේ දී තීරණය විය. එම සමාජයේ ලේකම් වන අරුණ සිල්වා ඔබ යැයි සිතා ඒ සඳහා භූමියක් වෙන්කර දෙන ලෙස ඉල්ලා ප්‍රාදේශීය ලේකම් වෙත යැවීමට ලිපියක් ලියන්න. ක්‍රීඩා පිටියක අවශ්‍යතාව හා ඉන් සැලසෙන සේවාව, තම සමාජය පිළිබඳ විස්තර, ලබාගත හැකි පරිත්‍යාග හා සහයෝගය දක්වන ස්වේච්ඡා සංවිධාන ආදී විස්තර ද ලිපියේ ඇතුළත් කරන්න. (වචන 75 - 100 ක් ප්‍රමාණවත් ය.)

(ලකුණු 15)

## iii කොටස

06. අර්ථ රසයෙන් සහ ශබ්ද රසයෙන් යුක්ත කවි රචනා කිරීමට ගුත්තිල කතුවරයා සමත් වී ඇත. නිදසුන් මගින් සනාථ කරන්න.

(ලකුණු 15)

07. අපූරු මිතුරු දහමක් පිළිබඳ ව කදිම විස්තරයක් විජයබා කොල්ලය නවකතාවෙන් ලබා දේ. නිදසුන් සහිත ව පැහැදිලි කරන්න.

(ලකුණු 15)

08. සරණංකර සංඝරාජ හිමියන්ගේ ප්‍රයත්නය වූයේ සිල්වත්, ගුණවත්, ආදර්ශවත් සඟ පරපුරක් බිහි කිරීම යි. සංඝරාජ සාධුචරියාවේ තොරතුරු අනුව මේ කියමන පිරික්සන්න.

(ලකුණු 15)